## චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව

ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන
නියෝජිතායතනය




ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා
සංවර්ධන නියෝජිතායතනය

# ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය සඳහා නිර්දේශිත ප්‍රදේශ

නිකුත්කල දිනය: 13.01.2021

| අක්ෂාංශ | | | දේශාංශ | | | පන්න ගැඹුර |
|---|---|---|---|---|---|---|
| අංශක | මිනිත්තු | | අංශක | මිනිත්තු | | බඹ |
| 13 | 42 | N | 86 | 90 | E | 84 |
| 10 | 80 | N | 84 | 26 | E | 62 |
| 08 | 22 | N | 88 | 60 | E | 100 |
| 08 | 36 | N | 88 | 48 | E | 89 |
| 02 | 22 | N | 81 | 80 | E | 114 |
| 09 | 43 | N | 68 | 70 | E | 93 |
| 07 | 20 | N | 64 | 35 | E | 68 |
| 05 | 20 | N | 65 | 22 | E | 54 |
| 03 | 54 | N | 66 | 18 | E | 68 |
| 04 | 20 | N | 68 | 10 | E | 83 |
| 02 | 39 | N | 67 | 30 | E | 73 |
| 00 | 80 | N | 65 | 50 | E | 70 |
| -00 | 22 | S | 67 | 39 | E | 70 |
| -02 | 58 | S | 78 | 40 | E | 110 |
| -05 | 56 | S | 76 | 20 | E | 37 |
| -06 | 16 | S | 79 | 13 | E | 40 |

ටෙලි/ ෆැක්ස් 011-250193 / 0112520367

මෙම නිර්දේශය වලංගු වන්නේ නිකුත් කළ දින සිට දින 3-5 ක් දක්වා පමණි.

## බහුදින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය
## උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශය සඳහා
## (2021 ජනවාරි මස 13 දින පෙ.ව. 07.00 ට ඉදිරි දින තුන සඳහා නිකුත් කරන ලදී.

දිවයින අවට මුහුදු ප්‍රදේශ

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. මඩකලපුව සිට හම්බන්තොට හරහා ගාල්ල දක්වා වන මුහුදු ප්‍රදේශවල ඇතැම් ස්ථානවලට තද වැසි ඇතිවිය හැක.
කොළඹ සිට පුත්තලම, කන්කසන්තුරය සහ ත්‍රිකුණාමලය හරහා මඩකලපුව දක්වා මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දෙසින් හමන අතර සෙසු මුහුදු ප්‍රදේශවල වල සුළං නිශ්චිත දිශාවකින් තොරව හමයි. සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ. පුත්තලම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 පමණ දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී.
පුත්තලම සිට කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ මද වශයෙන් රළු විය හැක.
ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

ශ්‍රී ලංකාවට බස්නාහිර සහ නිරිත දෙසින් වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශයේ **(02N-08N, 70E-80E)** පවතින ක්‍රියාකාරී වලාකුළු පද්ධතිය හේතුවෙන්, එම මුහුදු ප්‍රදේශවල ඉදිරි පැය **24** තුලදී තද වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව **(පැ.කි.මී. 70-80 පමණ)** ඉහළ යාමට ඉඩ ඇති හෙයින් එම මුහුදු ප්‍රදේශ ක්ෂණිකව රළු වීමට වැඩි හැකියාවක් පවතී.

ධීවර සහ නාවුක ප්‍රජාව මේ පිලිබඳව ඉතා අවධානයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය

කාලගුණික තත්ත්වය:
00-10N, 80E-92E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
00-08N, 92E-100E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
10N-13N, 80E-85E : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ප්‍රධාන වශයෙන් වැසි රහිත.

සුළං තත්ත්වය :
06N-15N, 80E-85E : නැගෙනහිර සිට ඊසාන දක්වා දිශාවලින් / පැ.කි.මී (30-40), විටින් විට පැ.කි.මී(50-60) දක්වා.
15N-20N, 80E-100E : ඊසාන දිශාවෙන් / පැ.කි.මී (20-35).
00-06N, 80E-84E : බස්නාහිර දිශාවෙන් / පැ.කි.මී (20-40), විටින් විට පැ.කි.මී 50 දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : වයඹ දිශාවෙන් / පැ.කි.මී (15-25).

මුහුදේ ස්වභාවය
06N-15N, 80E-85E : තරමක් රළු; විටින් විට රළු.
15N-20N, 80E-100E : තරමක් රළු
00-06N, 80E-84E : තරමක් රළු සිට රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : මද වශයෙන් රළු.

අරාබි මුහුද

කාලගුණික තත්ත්වය:
03N-12N, 70E-80E : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
05N-15N, 63E-70E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

සුළං තත්ත්වය:
00-06N, 70E-80E : වයඹ දිශාවෙන් / පැ.කි.මී (30-40); විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.
06N-10N, 75E-80E : වාමාවර්ථව භ්‍රමණය වේ / පැ.කි.මී (20-40); විටින් විට පැ.කි.මී. 50 දක්වා.
00-20N, 60E-70E : ඊසාන සිට වයඹ දක්වා දිශාවලින් / පැ.කි.මී (20-40).
සෙසු මුහුදු ප්‍රදේශ : ඊසාන හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී (15-20).

මුහුදේ ස්වභාවය:

| | |
|---|---|
| 00-06N, 70E-80E | : තරමක් රළු; විටින් විට රළු. |
| 06N-10N, 75E-80E | : තරමක් රළු සිට රළු දක්වා. |
| 00-20N, 60E-70E | : තරමක් රළු |
| සෙසු මුහුදු ප්‍රදේශ | : සාමාන්‍ය ස්වභාවය සිට මද වශයෙන් රළු දක්වා. |

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

කාලගුණික තත්ත්වය:

| | |
|---|---|
| 03S -10S, 80E-100E | : බොහෝ ප්‍රදේශවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි. |

සුළං තත්ත්වය:

| | |
|---|---|
| 00-10S, 60E-83E | : බස්නාහිර සිට වයඹ දක්වා දිශාවලින් / පැ.කි.මී.(30- 40); විටින් විට පැ.කි.මී.(50-60) දක්වා. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : වයඹ දිශාවෙන් / පැ.කි.මී. (20-35). |

මුහුදේ ස්වභාවය:

| | |
|---|---|
| 00-10S, 60E-83E | : තරමක් රළු සිට රළු දක්වා; විටින් විට ඉතා රළු. |
| සෙසු මුහුදු ප්‍රදේශ | : තරමක් රළු |

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

කාලගුණ විද්‍යාඥ
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව